# සීතාවක පුරාණය



# සීතාවක හා බැඳුණ වැදගත් ස්ථාන

**01.සීතාවක** :-
සීතා නදීය කැළණි ගඟට වැටෙන්නට පෙර තැනි බිමක් ඔස්සේ චක්‍රාකාර මගක ගලා බසී. එම පෙදෙස සීතාවකයි. දකුණු ඉන්දියාවේ කේරළ පෙදෙසේ -සීතා” ක්ෂේත්‍රම් සමග සීතාවක සසඳ බැලීම කළ හැකිය. 16 වැනි සිය වසට පෙර සීතාවක නාමය සඳහන් ව ඇති බවක් නොපෙනේ.

**02. මායාදුනු පුර**:- ප්‍රදේශයේ පැරණි නාමයයි. මහයා කෙනෙකු උපන් ගම විය හැකිය. මානියම්ගම තිඹිරිපල වැනිගම් හා සම්බන්ධවයි. සඩ වැනි පැරකුම් රජු කළ මායාදුනු පුරයෙහි උපුල්වන් දෙවොලක් ගොඩ නැගුණු බව සඳහන් වේ.

**03. මානියම්ගම** :- මහයා වැනි ප්‍රභුවරයකුට දුන් නින්ද ගමකි. මායාදුන්න, රාජසිංහ දෙරජුන් විසි රජමාලිගය පිහිටියේ මේ ගමේය. මහ පැරකුම් අවධියේ සිට ප්‍රසිද්ධ ග්‍රාමයකි. මානියම්ගම රජමහා විහාරයේ වාර්ෂික දුරුතු පෙරහර දිවයි-න් ප්‍රසිද්ධය.

**04. තල්දුව** :- මහනුවර විෂ්ණු දේවාලය සතු ගමකි. තෙල්දුව, තල්දුව වු බව පිළිගැනේ. දේවාලයට පොල්තෙල් හා කොප්පරා සැපයු ගමක් සේ ප්‍රසිද්ධය. හෛරව කෝවිල පිහිටියේ ද මේ ගමේය.

**05. අවිස්සාවේල්ල**:- මේ නම පිළිබඳ මතභේද ඇත. යුරෝපීය, පාලන කාලයේදී මේ නම භාවිතයට එන්ට ඇත. වසුවිල අවසුවිල වී අවසුවෙල වී පසුව අවිස්සාවේල්ල වු බව සිතිය හැකිය.

**06. මාපිටිගම**:- වැද්දවල මාපිටිගම බෝරුප්පා-වක් යටදී රාජසිංහ රජු (ගණේගොඩ දෙව්) බන්ධනය කිරිම පිණිස පිරිත් දෙසමින් සිටි භික්ෂු පිරිසක් රජුගේ දඬුවම් වලට ලක් වු බව ගනේගොඩ පුවතේ සඳහන් වේ.

**07. මැදගොඩ** :-
රාජසිංහ රජු ගොඩ නැගු සිද්ධ පත්තිනි දේවාලයයි මෙහිදී ගණේගොඩ දෙවියන්ද පුදනු ලැබේ.

**08. කබුළු මුල්ල**:- රාජසිංහ රජු ගොඩ නැගු සිද්ධ පත්තිනි දේවාලයයි. මෙහිදී ද ගණේගොඩ දෙවියන් පුදනු ලැබේ.

**09. දැරණියගල** :-
දෙරන ඉහ ගල දැරණියගල වන්ට ඇත. කෝට්ටේ රජු පරංගීන් සමග විත් සීතාවකට පහර දුන් අවස්ථා වලදී මායාදුනු රජු දැරණියගලට ගොස් සැඟවී සිටිබව අසන්නට ලැබේ. දැරණියගල මහ සමන් දේවාලය ද එම පෙරහර ද දිවයිනේ ප්‍රසිද්ධය.

**10. තිඹිරිපල** :-
ප්‍රභූවරුන් ගේ තිඹිරි ගෙයක් මෙහි වීලු තිරඹිරිපල බණ්ඩාර නමින් සහෝදරයෙක් ටිකිරි බණ්ඩාර රාජසිංහට සිටියේය'යි ප්‍රසිද්ධය. ගඟ ඉවුරේ පිහිටි රංපත ගල මත පාසටහනක් වෙයි. ගඟින් එගොඩ රජලෙන පිහිටා ඇත.

**11. දියුරම් පීය** :-
වැරදි කරුවන් දිවුරු ස්ථානය සේ සැලකේ.

**12. තැලුම් පීය** :-
වැරදි කරුවන්ට දඬුවම් දුන් ස්ථානය සේ සැලකේ.

**13. ගැටහැත්ත** :-
සබරගමුව සීතාවක මාර්ගයේ විත් සීතාවකට ඇතුල්වන මුර පලයි. එහි හමුදවක් විය. එක්තරා ජන කථාවක් අනුව යැකෑදුරකු යක්ෂණියක් බන්ධනය කර ඇත්තේ ද මෙහිදීය. මංත්‍ර උසුරුවමින් ගැට හැත්තෑවක් සමුප්ර්න වු තැනයි.

**14. අටුළුගම** :-
ධාන්‍ය අටු තුබුණු ගබඩා ගමක් විය හැකිය. මෙහිදී ද බෝ රුප්පාවක් යට පිරිත් කියමින් සිටි භික්ෂු පිරිසකට රාජසිංහ රජු දඬුවම් කළ බව ගණේගොඩ පුවතේ සඳහන්ය.

**15. මාගම්මන** :-
ගජබා අවධියේ සිටි වු නිල යෝධයාගේ ගමයි මහා ගම්මානයකි.

**16. පෙතංගොඩ** :-
ගුරුගොඩ ඔය අසල පිහිටි මේ ගමේ උයනක් විය. එහිදී රාජසිංහ රජුට උනකටුවක් ඇනී ඔත්පල විය. කටු උන පඳුරු දෙකක් අදත් එහි ඇත.

**17. දුම්බු කඩුව** :-
සීතාවක ගඟ කැළණි නදීයට එක්වන තැනයි. බිම්කඩ තුනක් වෙන්වන තුන් භූ කඩ දුම්බු කඩුව වන්නට ඇත.

**18. කුරුපැත්ත** :-
පුරාණයේ ඇතුන් සිට කැලෑවක් (බැද්දක්) විය හැකිය. කුරු බැද්ද කුරුපැත්ත වන්නට ඇත.

**19. හකුරුගල** :-
මෙහි පැරණි විහාරයක් ඇතත් ඒ ගැන දන්නා තොරතුරු ඉතාම අඩුය. රජු පැරදුණු කල බිසෝවරු මේ ගල පල්ලට පැන්න බව ජන කථාවේ එයි.

**20. කන්නත්තොට**:- මුස්ලිම් ජනතාව වැඩි ව යෙන් ජීවත්වන ගමකි. ගුරුගොඩ ඔය හරහා භික්ෂුන් ඒ මේ අත ගිය තොටුපකි. ගණතොට මුස්ලිම් වරුන්ට උච්චාරණය වන්නේ කනන්තොට වශයෙනි.

(ඔෟ) බුද්ධිමත් පාඨකයන්ගෙන් සැදුණු ප්‍රශ්ණ මෙසේ අමතමි.

එක බොරුවක් වසන්නට බොරු දහයක් කියන්න සිදුවේ. සීතාවක රාජසිංහ රජු පිළිබඳව සත්‍ය තොරතුරු වසන් වී ඇත්තේ

***රජුගේ මරණය වෙන ලෙසකින් වන්ට බැරිද? කුමංත්‍රණයක ප්‍රතිඵල වන්නට බැරිද එහි පාපය හා වගකීම කුමරුන් කෙරෙහි ආරෝපනය කළා වන්නට බැරිද?***

ඉතිහාසය ලියු අය පක්ෂපාතීව බොරු ගෙතූ නිසාය. රාජසිංහ ලදරු වයසේදීම රාජකම ඉල්ලු බවත්, පියරජු එය ප්‍රතික්ෂේප කළ බවත් ඒ නිසා පියා මැරූ බවත්, කුමාර අවධියේ කල හපන්කම් යුද ශිල්ප බලමින් පිදුරු ගොඩක සැඟවී සිටි පියා අහම්බෙන් කුමරුගේ කඩු පහක් ලැබ මියගිය බවත්, පියා මැරූ පව ගෙවීමට බැරියැයි කී භික්ෂුන් මැරවු බවත් ප්‍රතිෂ්ටා විරහිත චෝදනා හැටියට ඉවත ලන්නට සිදුවේ.

ටිකිරි කුමරු කුඩා කල සිටිම යුද ශිල්පයෙහි දක්ෂයෙක් විය. රණසුර අශ්වාරෝහකයෙක් විය. සියළුම යුද්ධ වලින් ජයග්‍රහණයම ලබා ගත්තේය. එනිසා මායාදුන්නේ පියරජු කුමරුට බොහෝ සෙයින් ඇළුම් කලේය. තමා ජීවත්ව සිටියදීම රාජ්‍ය විචාරීමත්, සියළුම බලතලතක් යුද කටයුතුත් කුමරුට පවරා තිබුණි. අපක්ෂපාතී ඉතිහාස පුවතක් සේ ගතහැකි එකම ග්‍රන්ථය වු රාජාවලියේ ඔය චෝදනා කිහිවක් සඳහන් නොවේ උඩරටදී කරල්ලියද්දේ හා කළ යුද්ධයෙන් ජයගෙන පැමිණි ටිකිරි කුමරු කෙරෙහි පැහැදුණු පියරජු ටිකිරි කුමරුට බළ සෙනග ශා යුද කටයුතු පවරා දුන් අන්දම රාජවලියේ මෙසේ විස්තර කරයි.

“මායාදුන්නේ රජ්ජුරුවෝ තමාගේ ශ්‍රී රාජසිංහ කුමාරයින්ට තමා ගේ ආඥාපනතට පවතින හැටිය පවතින්ඩ මහා සේවාවටත් රටවත් අවසර දුන්නාහ. එසේ අවසර ලැබ ගෙන කුමාරයා පියමහ රජාණන් සිත් ලෙසට විසුවාහ.”

ටිකිරි කුමරුගේ සෝයුරු තිඹිරිපල කුමරුට රජකම පැවරීමයි, භික්ෂුන් වහන්සේලා ගේ අපේක්ෂාව වුයේ, එහෙත් මායාදුන්නේ ගෙන් ඊට ඉඩනොලද විට කුමංත්‍රණ ඇතිවිය. තැනින් තැන පිරිත් පල වලදී භික්ෂුන් රැස්ව කතිතා කරන්නට ඇත. කුමරු අල්ලා මරවන්නට පවා අවස්ථාව සොයන්නට ඇත. යකු අල්ලා බන්ධනය කරන්නට සැරසුනේත් එය රජුට සැලවී එතැනට පැමිණ භික්ෂුන් ඝාතනය කිරිමට යොමු උනේත් මේ හේතුව නිසා නොවිය හැකිද? ගණේගොඩ දෙව් දුටු විට භික්ෂුන් බියවී අවසිහියෙන් පැමිණ කණ මැදිරි වලට පැන්න බව ජනවහරට එක්වී ඇත.



ශාස්ත්‍රවේදී
නා. ලි. සාර්ලිස් අමරසිරි

“දේව රජසිහ නමින් මෙලක තුළ රජ පැමින සත් වසක් යෙහෙන් වැස පළමු කළ පිං බලෙන් නොමලකය එර්දියෙන් දේවකය මැවීලා තෙද විකුම් පා ලොවට”

ගණේගොඩ යාදින්නේ”එන මේ පාඨය විමසිය යුත්තකි. රජු මරන්නට කළ වෑයමක් ව්‍යර්ථ වීමෙන් පසු තවදුරටත් ජීවත්වන විට දේවත්වයෙන් සැලකුවා වන්නට බැරිද?

ක්‍රි.ව. 1530 දී භුවනෙකබාහුත් මායාදුන්නේත් රජවිය. ක්‍රි.ව. 1551 දී භුවනෙකබාහු මියගියේය. ගණේගොඩ පුවත හා යාදින්න අනුව බිසෝවරුනට යකුත් ආවිෂ්ට උනේත් ටිකිරි බණ්ඩාර උපන්නේත් මේ අතර කාලයේය. සුප්‍රසිද්ධ මුල්ලේරියා වෙල සටනින් රාජසිංහ කුමරු පෘතුගීසින්ට අමතක නොවන පහරක් දුන්නේ ක්‍රි.ව. 1559 දීය. එවිට කුමරුගේ වයස අවුරුදු 12 නම් ඔහු උපදින්නට ඇත්තේ ක්‍රි.ව. 1547 දී වී යුතුය. ක්‍රි.ව. 1581 දී පියා මළ පසු ඔහු රජ උනේ වයස අවුරුදු 34 ක්වත් වු පසුවය. 1592 දී මියගියේ වයස අවුරුදු 45 දී පමණ විය හැකිය. ලාබාල වියේදීම රජකම ඉල්ලීම පියරජු එය ප්‍රතිෂේප කිරිම ඒ නිසා ඔහු අතින් රජු මියයාම එසේත් නැතිනම් ලා බාල කුමරුගේ යුද්ධ ශිල්ප බැලීමට පිදුරු ගොඩක් තුළ සැඟවී සිටිම පුතාගෙන් අහම්බෙන් කඩු පහරක් එල්ලවීම යන මේ සියල්ලම පිළිනොගෙන ඉවත හලයුතු ප්‍රලාප නොවේද?

රාජසිංහ රජුට විරුද්ධ අනිත් චෝදනා ශිව සමය පිළිගෙන අරිට්ට කී වෙණ්ඩුට මුල් තැන දී භික්ෂුන් ඝාතනය කිරිමයි. පිය රජු මිය ගිය පසු රජුට මහත් සිත් තැවුලක් ඇතිවිය. භික්ෂුන් වහන්සේලා කැඳවා සාකච්ඡාවක් පවත්වා ඇත. එතැනදී ස්ථිවිර භික්ෂුන් නොබැණ සිටි බවත් සාමණේර නමක් පමණක් පිළිතුරු දුන් බවත් ගණේගොඩ යාදින්න පවසයි. මෙතන සිදු වු දේ කුමක්ද'ය සිතමුද? තිඹිරිපල කුමරුට රජකම නොදී පියා සිටියදීම රාජසිංහට රාජ්‍ය කටයුතු පැවරිම නිසා භික්ෂුන් වහන්සේ මේ දෙදෙනා කෙරෙහි සුහද භාවයක් නොපෙන්වුහ. රජුගේ මරණය වෙන ලෙසකින් වන්ට බැරිද? කුමංත්‍රණයක ප්‍රතිඵල වන්නට බැරිද එහි පාපය හා වගකීම කුමරුන් කෙරෙහි ආරෝපනය කළා වන්නට බැරිද? භික්ෂුන් කෙරෙහි රජු කිපුනේත් ශිව සමය වැලඳ ගත්තේත් ශ්‍රී පාදය හා බිරාඩි දෙවොල අරිට්ට කී වෙණ්ඩුවට පැවරුනේත් ඒ නිසාය. මෙතනැදී ප්‍රභූවරුනුත් ඇතැම් හමුද නායකයනුත් විරුද්ධ කම් පෑහ. වික්‍රමසිංහ මහ සෙනෙවි පවා මුල්ලේරියා වෙල සටනේදී පසු බැස්සේය. රජුට එල්ලෙන්නට තිබුණු එකම අත්ත ඔහුට හිතවාදී වු අරිට්ට කී වෙණ්ඩු හා ඔහුගේ මලබාර් සේනාවය. ප්‍රදේශය තුල පත්තිනි දේවාල කීපයක්ම රජු ඉදී කළේය. එහෙත් පංසලක් විනාශ කොට දෙවොලක් තැනු තැනක් මෙතෙක් නොදත්තෙමු. මානියම්ගම විහාරයටවත් රජුගෙන් හානියක් සිදු වු බවට ස්ථිර සාක්ෂියක් නොමැත.

රාජසිංහ රජු පිළිබඳ සත්‍ය කරුණු අනාවරණය කරගත හැක්කේ මෙබඳු විචාරාත්මක ගවේෂණයකින් පමණි. ක්‍රි.ව. 1592 දී මියගිය රජතුමා සාමාන්‍ය ජනතාව විසින් දේවත්වයේ ලා පුදන්නට පටන් ගන්නේ ඔහු තුළ වු සුර වීර වික්‍රමාන්විත ජාතී හිතෛෂී ප්‍රතාපවත් ගුණය නිසාය.

**පසුවදන**

*“සීතාවක පුරාණයට පෙර වදනක් ”ලිපියෙන් වර්ෂ 2009 ජනවාරියේ අප හඳුන්වා දුන් පරිදි පුරාවිද්‍යා චක්‍රවර්තී මහාචාර්ය සෙනරත් පරණවිතානයන්ගේ මෙන්ම මහාචාර්ය එදිරිවීර සරච්චින්ද්‍රයන්ගේ ශිෂ්‍ය රත්නයක් වුත්, උපාධිධාරී ගුරුවරයෙකු හා විදුහල්පතිවරයෙකු වුත්, දැනට විශ්‍රාමිකව විෂ වෛද්‍යවරයකු හා නෂ්ත්‍රාචාර්යවරයකු වශයෙන් අවිස්සාවේල්ලේ තල්දුව ප්‍රදේශයේ ගම්වාසීන්ට අමිල සේවාවක යෙදෙන ශාස්ත්‍රවේදී නා.ලි. සාර්ලිස් අමරසිරි වියතාණන්ගේ -සීතාවක පුරාණය ග්‍රන්ථය ඇසුරින් සැකසුන ලිපි පෙළ මින් නිමා වේ.*

*එතුමන් විසින් රචිත සිංහල සංස්කෘතිය හා බැඳුන වෙනමම ආකාරයේ ලිපි පෙළකින් නුදුරේදී ‘සන්නස’ හැඩවනු ඇත.*

***-සන්නස-***

